

# එයා තව එක සැරයක් මා දිහා හැරිලා බැලුවා නම්....



සමාජයේ පොහොසත්ම පුද්ගලයෝ කලා ශිල්පියෝය.. සමාජය වැඩන්නේත් පෝෂණය වන්නේත් ඔවුන් නිසාය.. ඔවුන්ගේ වත්කම් මිල මුදල් යාන වාහන ඉඩ කඩම් වැනි භෞතික සැප සම්පත් නොවේ. නිර්මාණාත්මකභාවයයි. ඒ සඳහා වෙහෙස මහන්සි වී දර දිය ඇදීමයි. එපමණක්ද නොව. පොදු රසිකයාගේ ජීවිත සැහැල්ලු කිරීමට අවශ්‍ය අදෘෂ්‍යමාන සේවය ලබා දෙන්නේත් කලා ශිල්පියායි.. එනිසා ඔවුනගේ නිර්මාණ රුපියල් සත වලින් අගය කරමින් නවතින්නට නොහැකිය. කවුරුන් හෝ මුදලින් තක්සේරු කරනු ලබන්නේ නිර්මාණයක බාහිර පෙනුම මිස එහි ඇති ආත්මය නොවේ. නිර්මාණය ආත්මය නිතරම බැඳී ඇත්තේ කලා ශිල්පීන්ගේ ආත්මය සමගයි. සිනමාව නමැති ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධයෙන් හා නාට්‍ය කලාවෙන් ජනතාව අවදි



ප්‍රසන්න විතානගේ

කරන්නට සැමදා වෙහෙසෙන අලුත් යමක් හිතන්නට පොළඹවන ප්‍රසන්න විතානගේ වැනි නිර්මාණවේදීන් ඔවුන්ගේ නිර්මාණ සමග අප හදවත් තුළ අමරණීය වන්නේ එනිසාය. මා මෙසේ කියන්නේ පසුගිය 17 වන දා එපින් රිඩින් සිනමා ශාලාවේදී නැරඹූ ප්‍රසන්න විතානගේ නම් ප්‍රතිභාපූර්ණ සිනමාවේදියාගේ "ඔබ නැතුව ඔබ එක්ක" සිනමා කාව්‍යය නරඹා ප්‍රේක්ශකයන් ශාලාවෙන් ඉවතට පියවර මැන්නද මා හට නැගිටීමට උවමනාවක් නොවීය. මම කැළඹුන සිතින් වාඩිවී සිටි තැනම වාඩිවී සිටියෙමි.

ආදරය. අපි හැමදාම කතා කරන මාතෘකාව. කවදා කතා කළ ද කොතැනක කතා කළ ද එහි ඇති චමත්කාරය නිබඳ අප වෙලා ගනියි. මේ සිනමා පටයෙන්ද ප්‍රසන්න ඉදිරිපත් කරන්නේ ආදරය නමැති පොදු සංකල්පය වුවද ඒ තුළින් අපේ හදවතේ ගැඹුරුම තැනට කතා කරමින් අරුත් බර සංවේදනයකින් ඒ දෙස නෙත් යොමන්නට ඔහු අප යොමු කරවයි.

චිත්‍රපටයේ සිනමාරූපී බව ගොඩනගා ගැනීම සඳහා යොදා ගත් විශිෂ්ට කැමරාකරණය සංස්කරණ රීතිය ඉතා මැනවින් හසුරුවමින් ප්‍රසන්න ප්‍රේක්ෂකයාට සිනමා රසාස්වාදය ලබා දීමට ගන්නා ප්‍රයත්නය ඉතා අගනේය. නුවරඑළිය යන නම ඇසූ පමණින් අපට දැනෙන්නේ ඉතාමත් චමත්කාර මීදුමින් වැසුණ ප්‍රදේශයකි. මල් වලින් පිරුණ නිල් කඳුපන්තියෙන් වටවුණ හා හරිතවර්ණ වෘක්ෂ ලතාවද එළවළු සහ තේ වතු වලින් නැගෙන මිහිරි ආස්වාදයයි. නමුත් මේ චිත්‍රපටයේ රූප රාමු වලින් අපට පෙනෙන නුවරඑළිය මොන තරම් වෙනස්ද? ලයිම් ජීවිතය දරිද්‍රතාව උගස් බඩු කඩයට පැමිණෙන දුගී දුප්පත් ජනතාවගේ මැළවුණ දුක්බර මුහුණු අපි දකින නුවරඑළියට වඩා මොන තරම් වෙනස්ද? යථාර්ථවාදී නුවරඑළිය මවන ප්‍රසන්න මහින්දපාල නමැති අතිදක්ෂ කැමරා ශිල්පියාගේ කැමරා කාචයෙන් හා ආලෝකකරණයෙන් අඳුරු වර්ණ යොදා ගනිමින් අපූරු අරුතක් චිත්‍රපටය සඳහා ගොණු කර ගන්නට සමත් වී ඇත. මෙහි ඇති තවත් විශේෂයක් වින්නේ විෂය කරගත් කතා පුවත සංකීර්ණ තලයකට ගෙනෙමින් ඒ තුළ දෝලනය වන සියළු චරිත හා ජීවිත විනිවිද දකිමින් මානුෂික සබඳතා මනා ලෙස ගොඩනගා තිබීමයි.

සැබෑ සත්‍යය බොහෝ විට දෘෂ්‍යමානයෙන් වෙනස්ය. එබැවින් ඒ විනිවිද ගොස් සැබෑ සත්‍යය ගවේශණය කිරීම කලා ශිල්පියාගේ යුතුකමයි. මේ චිත්‍රපටය නැරඹූ බුද්ධිමත් ප්‍රේක්ෂකයා මගේ අදහසට එකඟවේ යයි මම සිතමි. අපි කිනම් හෝ කලා කෘතියක් නැරඹීමේදී මූලික කරගත යුතු කරුණු කීපයක් ඇත . එනම් යම්කිසි නිර්මාණයක් නැරඹීමේදී පූර්ව විනිශ්චයකින් යුතුව නිර්මාණය රසවිඳින්නට උත්සාහ ගැනීම නිවැරදි රසවින්දනය නොවේ. සමස්ථ කතා කෘතියක් නැරඹිය යුත්තේ එය ගොඩ නගා ඇති සංකල්පය වටහා ගැනීමෙන් මිස එහි එන දෙබසකින් දෙකකින් නොවේ.

අපි විදෙස් රටක ජීවත් වන බැවින් ලංකාවේ සිටිනවාට වඩා මානුෂිකව හා විනිවිද භාවයෙන් යුක්තව යමක් දෙස බැලීමේ ශික්ෂණයක් අපට තිබේ. අප ජීවත්වන බහු ආගමික හා බහු සංස්කෘතික පරිසරය අපට ඒ හැකියාව ලබා දී ඇත.

එල්ටීටීය මුදාහළ භීෂණයේදී කිසිදා සමාව දිය නොහැකි වැරදි රාශියක් ඔවුන් අතින් සිදුවී ඇති බව නැවත ලිවිය යුතු නැත. නමුත් අප වටහා ගත යුතු දෙය වන්නේ සියළුම ද්‍රවිඩයන් එල්ටීටීඊ කාරයන් නොවන බවය. චිත්‍රපටයේ තරුණියගේ සොහොයුරා අතුරුදන්වන්නේ ඔහු එල්ටීටීඊ සංවිධානයට සම්බන්ධයක් නැතිව සිටියදීය. දෙමාපියන් තරුණිය නුවරඑළියට ගෙනැවිත් රඳවන්නේ ඇයට ආරක්ෂාව ලබා දීම සඳහාය. ආරක්ෂා විය යුත්තේ කාගෙන්ද? තමා නොදැනුවත්ව විවාහ වී සිටින්නේ හිටපු හමුදා භටයකු සමගය යන්න දැනගන්නා තරුණිය කම්පනයට පත්වීම අප තේරුම් ගත යුත්තේ කෙසේද? මා සිතන ආකාරයට යුද්ධය නිමා වී මේ සා කාලයක් ගතවූ පසුවත් අප තාමත් සිතන්නේ කල්පනා කරන්නේ දෙමල ජනතාව දෙස බලන්නේ අධිපතිවාදී මානසිකත්වයකින් බවය. මේ සියල්ල සමහන් වන දිනයක් තිබේද? දෙමළ ජනතාව සිහලයන් දෙස සැකයෙන් බැලීමත් සිංහලයන් දෙමළ ජනයා දෙස සැකයෙන් බැලීමත් අවසන් වන දිනයක් එනු ඇතිද? ප්‍රසන්න අපෙන් ප්‍රශ්න කරන්නේ මේවායි.

ඒ අතරේ ප්‍රේමය නම් වන අති පාරිශුද්ධ සංකල්පය හමුවේ මානුෂිකත්වය ජනිතවන ආකාරය ඔහු අපට පෙන්වා දෙයි. හිටපු හමුදා සොල්දාදුවා තමා සැබැවින්ම මේ ද්‍රවිඩ තරුණියට පෙම් කරන බවත් ඒ තුළ වංක බවක් නොමැති බවත් අපට පසක් වද්දී හමුදා භටයා පිළිබඳ සුබවාදී ආකල්පයක් ප්‍රේක්ෂකයා ගේ සිත තුළ මැවෙයි. සිය සැමියාට අවංක ලෙස පෙම් කිරීමේ අභිලාශය ද්‍රවිඩ තරුණිය තුළ වැඩෙත්ම ඇය මුහුණ දෙන මානසික ආතතිය වටහා ගැනීමේ හැකියාවක් අපට තිබිය යුතුය. ඒ ආතතිය කෙතරම් ප්‍රහලද යන්න තේරුම් ගන්නට නම් අප දෙමළ ඇසින් සමාජය දෙස බලන්නට උත්සාහ කළ යුතුවෙයි. මේ සියල්ල නිමවන මොහොතේ අපේ දෑස් තුළට ප්‍රසන්න එක් කරන කඳුළෙ තුළ ජාතිකත්වය පිළිබඳ හැඟමක් වෙනුවට සමස්ථ මනුශ්‍ය වර්ගයා පිළිබඳවම කම්පාවක් රැඳී තිබුණා ඔබට දැනුනාදැයි මම නොදනිමි.

බොළඳ හරසුන් නිර්මාණ එක පිට එක ගෙන්වා අපට ප්‍රදර්ශනය කෙරෙන මෙවන් යුගයක අවදානමක් සහිතව මෙවැනි අගනා කලා කෘතියක් ප්‍රදර්ශනය කළ විකසිත කලා කවයට මල් මිටක් පුදන්නට කැමැත්තෙමි.

මහාචාර්ය සරච්චන්ද්‍රයන් කියූ ආකාරයට " ආදරය යනු දෙන දෙයක් මිස ලබා ගන්නා දෙයක් නොවේ" චිත්‍රපටයේ අවසාන දෙබස් ඛණ්ඩය මගේ සවනේ තවමත් දෝංකාර දෙයි.

**"එයා තව එක සැරයක් මා දිහා හැරිලා බැලුවා නම්...."**



ශ්‍රීනාත් මීද්දුමගේ